UPDF
WWW.UPDF.COM

ආයතනයේ නම : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ඟිණුම් කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் : தேசிய விலங்கியல் தோட்டங்கள் துறை

நிலையியற் கட்டளையின் இலக்கம் 119 (4) இன்படி விதிமுறைகளில் பொது கணக்கு குழுவினால் வழங்கப்பட்ட அறிக்கைக்கு ஏற்ப எடுக்கப்பட்ட நடவடிக்கைகளும் மற்றும் கௌரவ அமைச்சர் அவர்களின் அவதானிப்புகளினதும் சமர்ப்பிப்பு

Name of the Institution: Department of National Zoological Gardens

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)

UPDF
WWW.UPDF.COM

පාර්ලිමේන්තු සැසිවාර අංකය : 290

ආයතනයේ නම : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

	මූල්‍ය නීතිරීති හා කාර්ය සාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගන්නා ලද දුර්වලතා	ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඒවායේ වර්තමාන තත්ත්වය
	පළමු කොටස	
01	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	හානි පිළිබඳ ලේඛනය පවත්වාගෙන යනු ලබන අතර, එය මේ වනවිට යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
02.	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණන විමසුම් සඳහා පිළිතුරු බොහෝ අවස්ථාවලදී මසක් ඇතුළත සපයා ඇති අතර ඇතැම් අවස්ථාවලදී උප කාර්යාල මඟින් පිළිතුරු ගෙන්වා ගැනීමේදී ප්‍රමාද වීම් සිදුව ඇත. 2024 වර්ෂයේ සිට මෙම තත්ත්වය වලක්වා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
03	විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 2ක් වත් පවත්වා නොතිබුණි.	2021 වර්ෂයේ රට තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4ක් පැවැත්වීමේ හැකියාවක් නොපැවතුණු අතර, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති අංක DMA/AMC/A/2020/5-4 හා 2020.06.11 දිනැති ලිපිය මඟින් DMA/01-2019 චක්‍රලේඛයේ 5 ඡේදය ඉටුකිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමක් සිදු කර ඇති බව දන්වා සිටිමි. තවද, 2022 වර්ෂයේ සිට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්වීම සිදුකරනු ලබන අතර, 2024 වර්ෂයේද පළමු කාර්තුවට අදාල රැස්වීමද මේවනවිට පවත්වා ඇති අතර එම කමිටු රැස්වීම් මඟින් දෙපාර්තමේන්තුවට අදාළ වැදගත් කරුණු සාකච්ඡා කිරීම් සිදුකරනු ලබන බවද වැඩිදුරටත් දන්වා සිටිමි.
04	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට	අප දෙපාර්තමේන්තුව යටතේ උප ආයතන 04ක් ක්‍රියාත්මක වන බැවින්, නියමිත කාල රාමුව ඇතුළත මු.රෙ 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකිරීමේදී සැලකිය යුතු කාලසීමාවක් ගතවන බැවින්,

UPDF
WWW.UPDF.COM

	අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2021 වර්ෂයේ හා 2022 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2023 වර්ෂය තුළ අවසන් කිරීමට කටයුතු කළ අතර, 2023 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණය මේ වනවිට අවසන් අදියරේ කටයුතු සිදුකරන බැවින්, මු.රෙ 756 (6) ප්‍රකාරව නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ හැකි බව කාරුණිකව දන්වා සිටිමි.
05	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	රාජ්‍ය ලාංඡනය පින්තාරු කළ විට වාහනයේ ආලේපිත පින්තාරුව විනාශවීමක් සිදුවන බැවින්, රාජ්‍ය ලාංඡනය Board 01ක් ආධාරයෙන් සකස් කර සියලු වාහනවල සවිකිරීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි.
06	වාහනයක් ගර්හිත වී මාස 8කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 01/2015 විධිවිධාන අනුව වාහන අපහරණ කටයුතු සිදුකිරීමේ දී වාහනවල අනන්‍යතාවය පිළිබඳ ගැටලු විසඳාගැනීමට විශාල කාලයක් ගතවූ බැවින් මේ වනවිට වාහන අපහරණය සඳහා මිල ගණන් කැඳවා අපහරණ කිරීමේ කටයුතුවල අවසන් අදියරේ කටයුතු කරමින් පවති. රා.මු චක්‍රලේඛ 01/2020 විධිවිධාන අනුව සමීක්ෂණ මණ්ඩලයක් පත්කොට අපහරණය කළ යුතු වාහන හඳුනා ගනිමින් පවති.
07	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	වර්ෂය තුළ පැවති Covid තත්ත්වය හේතුවෙන් නිලධාරීන් සීමාසහිතව සේවයට වාර්තා කළ අතර, රියදුරු මහතුන්ද අත්‍යවශ්‍ය සේවා මත සේවයට වාර්තා කරන ලදී. එබැවින්, ලොග් පොත් යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් ගැටලු පැවති අතර, එම තත්ත්වය නිරාකරණය කර සියළුම ලොග් පොත් මේ වනවිට යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි.
08	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	ඉන්ධන දහන පරීක්ෂා කිරීම 2021 වර්ෂයේ පැවති Covid තත්ත්වය හේතුවෙන් නිසිලෙස සිදුනොවුනද, 2022 වර්ෂයේ සිට ඉන්ධන දහන පිළිබඳ වාර්තා උප ආයතනවලින් අඛණ්ඩව යොමුකිරීම් නිසිපරිදි සිදුකරයි.

UPDF
WWW.UPDF.COM

09	සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයේ මැයි මස සිට බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
10	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	2021 වර්ෂයේදී පැවති කොරෝනා වසංගත තත්ත්වය මත ආයතන වසරේ වැඩි කාල සීමාවක් වසා පැවතීමත්, නැපැල් සේවාවන් අක්‍රියව පැවතීමත් මත බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව පැවති ශේෂ සම්බන්ධයෙන් මසක් ඇතුළත කටයුතු කිරීමට නොහැකි වූ අතර මේ වනවිට එම සියලුම ගැලපීම් නිවැරදි කිරීම සිදුකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. එසේම මේ වනවිට බැංකු සැසඳුම් ප්‍රකාශ මගින් අනාවරණය වන ගැලපුම් මසක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කර ඇති බවද වැඩිදුරටත දන්වා සිටිමි.
11	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ සියළුම තැන්පතු මේ වනවිට නිරවුල් කිරීමට කටයුතු කර ඇතිබව දන්වා සිටිමි.
12	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	ප්‍රායෝගිකව පැන නැඟුන ඇතැම් තත්ත්වයන් හේතුවෙන් ලබාගන්නා ලද තත්කාර්යය අතුරු අග්‍රිම මාසයක් තුළ නිරවුල් කිරීම සිදුකර නොමැති අතර මේ වනවිට මෙම තත්ත්වය හැකිතාක් වලක්වා ගැනීමට ගැනීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
	දෙවන කොටස	
01	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2021 වර්ෂයේ රාජ්‍ය මූල්‍ය පාලනය සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම නිසා නිලධාරීන්ට පුහුණු අවස්ථා ලබාදී නැත.
02.	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 වර්ෂයේ පැවති Covid වසංගතය හේතුවෙන් නිලධාරීන් කැඳවීම සීමිත විය. සීමිත කාර්යය මණ්ඩලයක් මගින් දෙපාර්තමේන්තුවේ රාජකාරි ආවරණය කර ගත් බැවින්ද, මෙම රෝගය වැළඳීමේ අවධානම ඉතා ඉහල මට්ටමක පැවති බැවින් පුහුණු අවස්ථා සඳහා නිලධාරීන්ව යොමුකිරීම අපහසු විය.

UPDF
WWW.UPDF.COM

03	...නයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය. විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	2021 වර්ෂයේ විගණකාධිපති වාර්තාව මඟින් ලබා දී ඇති නිර්දේශ 2022 වර්ෂයේ 2023 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී සකස් කිරීමට කටයුතු කළ බව කාරුණිකව දන්වා සිටිමි.

.....

ගුණදාස සමරසිංහ,
ලේකම්,
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

ගුණදාස සමරසිංහ
ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ
අමාත්‍යාංශය

.....

එම්.එස්.එල්.ආර්.පී.මාරසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

එම්.එස්.එල්.ආර්.පී. මාරසිංහ
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
දෙහිවල